සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2025-01

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

De Mazenod College Kandana
55477

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි

නම / பெயர் / Name ................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ................

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි

## I කොටස

- පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදවලට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරන්න.

01. "පා හතරයි ඔළුවයි උගෙ ඉබි කබොල්ල ඇතුළට ඇදගත්තා"
    1. ඉබි කට්ට 2. ඉබ්බාගේ නිවස 3. ඉබ්බාගේ ගුහාව 4. ඉබ්බාගේ ජලාශය

02. "අපි, අලි මේ වනයේ අනාදි කාලයක් මුළුල්ලේ විසුමු"
    1. මෑත කාලයක සිට 2. ඉතා ඈත කාලයේ සිට
    3. සර්ව කාලීනව 4. ඉපදුන දා සිට

03. "පාරමී ධර්මයන් ආවර්ජනා කෙරෙමින් සත්‍ය ක්‍රියා කොට මුඛයෙන් පිඹපුහ."
    1. කල්පනා කරමින් 2. ආමන්ත්‍රණය කරමින් 3. මෙනෙහි කරමින් 4. භාවනා කරමින්

04. පහත දී ඇති යෙදුම් අතරින් ඉඟිවැකියක් නොවන පදය තෝරන්න.
    1. පරංගියා කෝට්ටේ ගියා වගේ 2. කිඹුල් කඳුළු
    3. සායම ගියා 4. ලෑල්ලට පැගුවා

05. "වැහැරෙනවා" යන වචනයේ සඳහන් පිල්ලම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
    1. කෙටි ඇදපිල්ල, කෙටි ඇදපිල්ල, කොම්බුව, ඇලපිල්ල
    2. කෙටි ඇදපිල්ල, ඇලපිල්ල, කොම්බුව, කෙටි ඇදපිල්ල
    3. ඇලපිල්ල, කෙටි ඇදපිල්ල, කොම්බුව, කෙටි ඇදපිල්ල
    4. කෙටි ඇදපිල්ල, කොම්බුව, කෙටි ඇදපිල්ල, ඇලපිල්ල

06. උත්තම, මධ්‍යම සහ ප්‍රථම පුරුෂ යන පුරුෂ තුන පිළිවෙලට දක්වා ඇති පිළිතුර තෝරන්න.
    1. මම, ගස, නුඹ 2. මම, නුඹ, අපි 3. අපි, ගස්, නුඹලා 4. අපි, ඔවුහු, නුඹලා

07. බහුවචන නාම පද පමණක් දැක්වෙන වරණය තෝරන්න.
    1. ගොවියා, බල්ලෝ, ඉබ්බෝ 2. ගොවියෝ, වඳුරා, ගස්
    3. ගස්, කම්කරුවෝ, ඉබ්බෝ 4. වඳුරෝ, ලේනා, පුටු

08. මුලින් දී ඇති වචනයට සමාන පදයක් නොදැක්වෙන පිළිතුර තෝරන්න.
    1. සතුටු - ප්‍රීතිය, සොම්නස, සන්තෝෂය, තුට
    2. සසල - චංචල, සෙලවෙන, සල, චල
    3. කැලෑව - වනය, වනාන්තරය, බැද්ද, වළ
    4. සූර්යයා - රවි, හිරු, දිනකර, දිනිඳු

09. සියලු පදවල අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පිළිතුර තෝරන්න.
1. දිළිඳු, උනුසුම, මැණියෝ
2. දිළිඳු, උණුසුම, මැණියෝ
3. දිලිඳු, උනුසුම, මැනියෝ
4. මැණියෝ, දිළිඳු, උනුසුම

10. පහත දැක්වෙන පද යුගලවල විරුද්ධාර්ථ පදයක් නොදැක්වෙන වරණය තෝරන්න.
1. ආගන්තුක - නේවාසික
2. සශ්‍රීක - නිශ්‍රීක
3. විදේශික - ස්වදේශික
4. විශේෂ - සුවිශේෂ

11. පහත දැක්වෙන පද යුගලවල සමානාර්ථ පදයක් නොදැක්වෙන පිළිතුර තෝරන්න.
1. ජලය - උදක
2. චංචල - නිශ්චල
3. නදිය - ගඟ
4. නිති - නිරතුරු

12. පහත සඳහන් වාක්‍ය අතුරෙන් නාම විශේෂණ පදයක් සඳහන් නොවන පිළිතුර තෝරන්න.
1. හොඳ ළමයි පින් කරති
2. අත්තම්මා සුදු සාරිය ඇඳ සිටී.
3. කියවීමට හොඳ පොතක් ගත යුතු ය.
4. නංගී හයියෙන් අඬයි.

13. පහත සඳහන් වාක්‍ය අතුරෙන් ක්‍රියා විශේෂණයක් සඳහන් නොවන පිළිතුර තෝරන්න.
1. ගංගාව වේගයෙන් ගලා බසියි.
2. ක්‍රීඩකයා සෙමින් දුවයි.
3. නංගී ලස්සන ගවුමක් ඇඳ සිටියි.
4. මල්ලී සතුටින් කෑ ගසයි.

14. මහාප්‍රාණ අක්ෂරයක් යෙදී නොමැති වචනය තෝරා යටින් ඉරක් අඳින්න.
1. ධර්මය
2. ප්‍රතිඵලය
3. තරඟය
4. පීඨය

15. පහත දැක්වෙන වචන යුගලය, වචනය හා අර්ථය ලෙස දක්වා ඇත. වැරදි අර්ථය සහිත පිළිතුර තෝරන්න.
1. සරණ - පිහිට
2. පැළ - කුඩා ගස්
3. වණය - කැලෑව
4. සරණ - හැසිරෙන

16. බහුවචන ක්‍රියාපද පමණක් සඳහන් පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
1. ලියති, ගයහු, කියවමු
2. කරති, කරහි, කරමු
3. බලමු, කියහු, ගයහි
4. කියවමි, කරහු, ලියති

- 17 සහ 18 ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව වැරදි වාක්‍ය තෝරා යටින් ඉරක් අඳින්න.

17. 1. ශිෂ්‍යයා පොත පාඩම් කරයි.
2. ක්‍රීඩකයෝ පිටියේ ක්‍රීඩා කරති.
3. නාහිමි විහාරයට වඩියි.
4. මා පොත පාඩම් කරමි.

18. 1. ඔවුහු වනයට පිවිසියේ ය.
2. මව දරුවන් රකින්නී ය.
3. ගංගා මුහුදට ගලා බසියි.
4. සංචාරකයෝ පෙරහැර නැරඹූහ.

19. පහත සඳහන් පෙළ පොතේ ඇතුළත් පාඩම් සහ ඒවායේ රචකයා වැරදියට දැක්වෙන පිළිතුර තෝරන්න.
1. අලි උවදුර - කුමාරතුංග මුනිදාස මහතා
2. ඇවිදින කොළයා - මාටින් වික්‍රමසිංහ මහතා
3. මරණ තුනක් ඇති මිනිසෙක් පැණි කෑය - ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ මහතා
4. රාසිං දෙයියන්ට බැණ වැදුණු මුරකරුවා - මාටින් වික්‍රමසිංහ මහතා

20. පහත සඳහන් කතුවරුන් විසින් රචිත කෘති පිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.
1. ඒ. පී. ගුණරත්න මහතා - A කියවන නුවණ
2. ඇම්. එල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා - B වටු කිරිල්ලී සහ තවත් කතා
3. කුමාරතුංග මුනිදාස මහතා - C සිරිත් මල්දම

1. B, C, A
2. B, A, C
3. A, B, C
4. C, A, B

## II කොටස

- 01 හා 02 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්යය වේ.
- 03, 04, 05, 06, 07 ප්‍රශ්න අතුරෙන් තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. ප්‍රස්තාව පිරුළුවලට අදාළ ව ඔබ සකස් කළ කේවල පැවරුම ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. ඔබ සකස් කළ කේවල පැවරුම සඳහා යෙදූ නම කුමක් ද? (ලකුණු 02)
2. මෙම පැවරුම සැකසීමේ දී තොරතුරු සපයා ගත් මූලාශ්‍ර 03 ලියන්න. (ලකුණු 03)
3. පැවරුම සාර්ථක කර ගැනීම සඳහා ගුරුතුමියගෙන් ඔබට ලැබුණු උපදෙස් තුනක් ලියන්න. (ලකුණු 03)
4. මෙම පැවරුම තුළින් ඔබට ලැබුණු ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)
5. තනිව මෙම පැවරුම ක්‍රියාත්මක කිරීමේ දී ඔබට මතුවූ ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 02)
6. පැවරුම සාර්ථක ව නිම කිරීමෙන් පසුව ඔබට දැනුණු සිතුවිලි කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 16)

02. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150ට නොඅඩු වන සේ රචනයක් ලියන්න.

1. පොත් පත් කියවීමේ වැදගත්කම
2. පරිසර පවිත්‍රතාව රැකගමු
3. කලා වැවයි ගොවි දිවියයි
4. උද්‍යානක අසිරිය

(ලකුණු 14)

03. උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වන තම හොඳම මිතුරාට යැවීමට සුදුසු සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

නැතහොත්

ඔබ පාසලෙන් වෙනත් පාසලකට මාරුවක් ලබා ගිය ඔබේ පන්තිභාර ගුරුතුමියගෙන් තොරතුරු විමසා ලිපියක් ලියන්න. (ලකුණු 10)

පහත සඳහන් 4 සහ 5 ප්‍රශ්නවලට පෙළපොත ඇසුරෙන් පිළිතුරු සපයන්න.

04. "ඔබ කුමක් කීවත් මම ඔබට මෙතැනින් යාමට ඉඩ නොදෙමි. ඒ මගේ සේවයයි"

1. මෙම ප්‍රකාශය සිදුකළේ කවුද?
2. එම ප්‍රකාශය සිදුකළේ කා හට ද?
3. ඉහත කොටස උපුටාගත් පාඩමේ නම ලියන්න.
4. මෙම පාඩම උපුටාගත් මුල් කෘතියේ නම ලියන්න.
5. එම කෘතියේ කතුවරයාගේ නම සඳහන් කරන්න. (ලකුණු 2 × 5 = 10)

05. "දරුවෙනි, මේ වනයෙහි විෂ වෘක්ෂයෝත් අමනුෂ්‍යාධිගෘහිත වූ පුෂ්කරණීහුත් වෙති"

1. මෙම ප්‍රකාශය සිදුකළේ කවුරුන් විසින් ද?.
2. එම ප්‍රකාශය සිදුකළේ කා හටද?
3. මෙම කොටස ඇතුළත් පාඩමේ නම ලියන්න.
4. පන්සිය පනස් ජාතක පොත ලියවුණේ කුමන රාජධානී සමයක ද?
5. පන්සිය පනස් ජාතක පොතේ ඇතුළත් කතා සංඛ්‍යාව කොපමණ ද?

(ලකුණු 2 × 5 = 10)

06. පහත පද්‍යය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"දිව වෙණ මිහිර පවතී කැත කොවුලු තුඩේ
මුතු ඇට සැදෙයි දිය යට බෙල්ලකු ගෙ බඩේ
සියපත් පිපෙනු ඇත පිළිගඳ ගොහොරු මඩේ
අගනා මැණික් කළුගල් අතරෙහි ද වැඩේ "

1. කොවුලාගේ ස්වභාවය කුමක් ද? උගේ නාදය ගැන ඔබට කුමක් කිව හැකි ද?
2. මුතු ඇට සැදෙන්නේ කොහේ ද?
3. සියපත් යනු මොනවාද? ඒවා පිපෙන්නේ කොහේ ද?
4. කුමන දේවල් අතරත් මැණික් සැදෙන බව කවියා පවසයි ද?
5. මෙම කවියෙන් අපට ලබාගත හැකි ආදර්ශයක් ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

07. **පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

දිනක් ඒ බුද්ධදාස නම් මහ රජතුමා මඟුලැතු පිට නැගී නහන පිණිස තිසා වැවට යමින් සිටියේ ය. එකල පුත්තාභාග නම් විහාරය අසළ තුඹසක් මත්තෙහි එක් නාග රාජයෙක් කුස රෝගයකින් පෙළෙමින් උඩුකුරුව නිදා හුන්නේ ය. රජතුමා ඔහු දැක, "මේ රෝගී එකෙකැයි" නිශ්චය වශයෙන් සිතී ය.

සත්පුරුෂ වූ ඒ මිහිපල් තෙමේ ඉක්බිති ඇතු පිටින් බැස ඔහු වෙත පැමිණ, "එම්බා, තොප මෙහි පැමිණි කාරණය මම දනිමි. තෙපි වූ කලී වහා කිපෙන සුලු කෙනෙකි. එහෙයින් තොප ඇඟ ස්පර්ශ කොට පිළියම් කරන්නට බිය වෙමි"යි කීය.

මෙසේ කීවා පමණෙකි. නාග රාජයා තමාගේ පෙණය තුඹසෙහි බහා ගෙන සන්සුන් ව හුන්නේ ය. එකළ රජතෙමේ තමාගේ හිණ තුබූ ආයුධය ගෙන ඔහු බඩ පළා දෝෂය බැහැර කොට අගනා ඔසු යොදා ඔහු සුවපත් කළේ ය. මෙසේ සුවපත් වූ ඒ නාග රාජයා තම හට කළ උපකාරය සලකා තමා ගේ මිණිරුවන ඒ රජු හට පූජා කළේ ය.

1. තුඹස පිහිටා තිබුණේ කොහේ ද?
2. නාගයා නිදමින් සිටියේ කෙසේ ද?
3. රජතුමා නාගයට කීවේ කුමක් ද?
4. රජු නාගයා සුවපත් කිරීමට ක්‍රියාකළේ කෙසේ ද?
5. කළගුණ සලකා ඒ නාගයා කුමක් කළේ ද?

(ලකුණු 2 × 5 = 10)

(මුළු ලකුණු 60 යි)